ආයතනයේ නම : විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය (119)

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තු වෙත ඉදිරිපත් කිරීම

நிறுவனத்தின் பெயர் : மின்சக்தி மற்றும் எரிசக்தி அமைச்சு (119)
பாராளுமன்றத்தின் அரச கணக்குக் குழுவினால் முன்வைக்கப்பட்ட அறிக்கை தொடர்பாக நிலையியற் கட்டளை இலக்கம் 119(4) இன் கீழ் கௌரவ அமைச்சரின் அவதானிப்புக்களும் மற்றும் அது தொடர்பாக எடுக்கப்படும் நடவடிக்கைகளும் பாராளுமன்றத்திற்கு சமர்ப்பித்தல்.

Name of the Institution: Ministry of Power and Energy (119)

Submission of observations of Hon. Minister and steps taken with regard to the reports tabled by the Committee on Public Accounts in terms of Standing Order No. 119(4)

**නොරොච්චෝලේ ලක්විජය ගල් අඟුරු බලාගාරය සඳහා 2022-2025 කාලපරිච්ඡේදයට අදාළව ගල් අඟුරු මිලදී ගැනීමේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය ඇගයීම සම්බන්ධයෙන් වූ විශේෂ විගණන වාර්තාව සම්බන්ධයෙන් පොදු ව්‍යාපාර කාරක සභාව මඟින් විමර්ශනය කරන ලද විශේෂ විගණන වාර්තාව සහ විමර්ශනයට ලක් කරන ලද කරුණු සම්බන්ධව සී/ස ලංකා කෝල් (පුද්) සමාගමේ නිරීක්ෂණ**

| | පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් ඉදිරිපත් කරන ලද නිර්දේශ | සී/ස ලංකා කෝල්(පුද්) සමාගමේ නිරීක්ෂණ |
|---|---|---|
| 01 | ගල් අඟුරු ප්‍රසම්පාදන ක්‍රියාවලියට සම්බන්ධ සියළු පාර්ශව රජයේ අනුමත ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුකූලව සිය වගකීම් නිවැරදිව ඉටු කරනු ලබන බවට තහවුරු කිරීම හා එම තත්ත්වයෙන් බැහැර වන පාර්ශවයන්ට එරෙහිව සුදුසු පියවර ගැනීමේ අවශ්‍යතාවය අවධාරණය කිරීම. | ප්‍රසම්පාදන කටයුතු නියමිත ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන් අනුකූලව සිය වගකීම් නිවැරදිව ඉටු කරන ලෙස අවශ්‍ය පාර්ශවයන් වෙත උපදෙස් ලබා දී ඇත. ඇතිවන සුවිශේෂී තත්ත්වයන් මත ඉන් බැහැර වීමට සිදු වන්නේ නම් පමණක් අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගනු ඇත. ඒ පිළිබඳව අදාල පාර්ශවයන් සමග සාකච්ඡා වට කිහිපයක්ම පැවැත්වීමෙන් පසුව අදාල තත්වයන් හඳුනාගෙන ඉදිරියේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුකූලව සිය වගකීම් වඩාත් නිවැරදිව ඉටුකිරීමට අවශ්‍ය උපදෙස් ලබා දී ඇත. |
| 02 | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2 ඡේදයේ සඳහන් අරමුණු වලට අගතියක් නොවන පරිදි සහ සැපයුම්කරුවන්ගේ මූල්‍ය ශක්‍යතාවය, පලපුරුද්ද, සැපයුමේ ගුණාත්මකභාවය, ප්‍රමාණවත් නෛතික බැඳීම් ඇතුළු මූලික අවශ්‍යතාවයන් ආරක්ෂා වන පරිදි ලංසුකරුවන් ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය පිළිගත හැකි මට්ටමකට ලිහිල් කර තරඟකාරීත්වය උපරිම කර ගැනීම පිළිබඳව අවධානය යොමු කිරීම. | මේ සම්බන්ධව අවශ්‍ය කටයුතු දැනටමත් සිදුකර ඇත. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2 ඡේදයේ සඳහන් අරමුණු වලට අගතියක් නොවන පරිදි සහ සැපයුම්කරුවන්ගේ මූලික අවශ්‍යතා ආරක්ෂා වන පරිදි සංශෝධනයක් ගෙන එමින් සැපයුම්කරුවන් ලියාපදිංචියට අදාලව පැවති GCV (Gross Calorific Value) අගය 5900 kcal/kg සීමාව ඉවත් කිරීමට කටයුතු කර ඇත. මෙමගින් වසර 03ක අත්දැකීම් ඇති ඕනෑම ගල්අඟුරු සැපයුම්කරුවකුට සහභාගීවීමට ඉඩ සලසා දීමෙන් තරගකාරිත්වය වැඩි කර ඇති අතර ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය පිළිගත හැකි මට්ටමකට ලිහිල් කර ඇති අතර ලංකාවට පමණක් නොව වෙනත් රටකට ගල් අගුරු සපයා පළ පුරුද්දක් ඇත්නම් එම තත්වයන්ද සැලකිල්ලට ගෙන ඇත. |
| 03 | ලංසු ලේඛනයන්ට සංශෝධනයක් සිදු කිරීමේදී අදාළ තහවුරු කිරීම් සහ බැඳීම් වලට අගතියක් නොවන පරිදි එවැනි සංශෝධනයන්ගේ නීත්‍යානුකූලභාවය තහවුරු කර ගැනීමෙන් පසුව එවැනි සංශෝධනයන් සිදු කල යුතු අතර, එම සංශෝධනයට ගැලපෙන පරිදි ලංසු ලේඛනයෙහි අනෙකුත් වගන්ති හා ගිවිසුම් සංශෝධනය කිරීමට වග බලා ගත යුතුය. ලංසු කැඳවීමෙන් පසු ලංසු ලේඛනයන්ට ප්‍රබල සංශෝධනයක් කිරීමෙන් හැකි සෑම විටම වැලකී සිටිය යුතුය. ලංසු ලේඛනයන්ට පසුව කරන සංශෝධනයන්හිදී එම සංශෝධනයන්ට අනුගත වීම සඳහා සියළුම ලංසුකරුවන්ට සාධාරණ කාලයක් ලබා දීමට ක්‍රියා කිරීම. | මේ පිළිබඳව අවධානය යොමුකර ඇති අතර ඒ අනුව සියළුම ලංසුකරුවන්ට සාධාරණ කාලයක් ලබා දීමට හා ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්හි 5.3.15 හි විධිවිධාන අනුව ප්‍රසම්පාදන වලදී එකී සංශෝධනයන් සිදු කිරීමෙන් වැලකීමට හැකි සෑම විටකම කටයුතු කරන අතර ලංසු ලේඛනයන්ට එවන් සංශෝධනයන් සිදු කරන අවස්ථාවන්හිදී එම සංශෝධනයන්ට අනුගත වීම සඳහා සියලු සැපයුම්කරුවන්ට සාධාරණ කාලයක් ලබා දීමට කටයුතු කරනු ඇත. |

| | | |
|---|---|---|
| 04 | ගල් අඟුරු ප්‍රසම්පාදනයේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව සකස් කල යුතු ප්‍රසම්පාදන සැලැස්ම පරිපූර්ණ ලෙස විධිමත්ව සකස් කර අනුමත කර එයට අනුගතව කටයුතු කල යුතු වීම සහ කාලීනව ගල් අඟුරු සැපයීම තහවුරු වන පරිදි මූල්‍ය සම්පාදනයන් පිළිබඳව පූර්ව එකඟතාවයක් ලබා ගැනීමේ හැකියාව පිළිබඳව අවධානය යොමු කිරීම. | ගල් අඟුරු සැපයීමේදී මූල්‍ය සම්පාදනය පිළිබඳව පැහැදිලිව එකගතාවන්ට පැමිණීමට මීට පෙර ක්‍රියාකර ඇත. නමුත් මෙම විමසුමට අදාළ කාලය තුළ කෝවිඩ් 19 වසංගත තත්වය සහ රටේ පැවති අයහපත් මූල්‍ය තත්වය හා ලංකා විදුලිබල මණ්ඩලයේ අයක්‍රම මගින් ලබාගත් ආදායම වියදම් පියවා ගැනීමට ප්‍රමාණවත් නොවීම මත, රුපියල් හා විදේශ විනිමය ද්‍රවශීලතා පිළිබඳවූ ඌනතාවයන් හා අරමුදල් සම්පාදනය කර ගැනීමේදී වූ බාධාවන් හේතු කොට ගෙන ඊට පෙර වාරයේ දී මෙන් මුදල් තත්වය සම්බන්ධ පූර්ව එකඟතාවයක් ඇති කර ගැනීම අපහසු විය. මෙම තත්වය විශේෂයෙන්ම ලංකාවේ පැවති අයහපත් ද්‍රවශීලතාවය සහ රටේ පැවති විදේශ විනිමය හිඟතාවය විශාල වශයෙන් බලපෑ අතර එය පාලනය කර ගත නොහැකි සාධකයකි. එම තත්වය හේතුවෙන් වෙනත් විකල්ප නොමැති බැවින් ප්‍රසම්පාදන ක්‍රියාවලිය අරඹනු ලැබුවේ දීර්ග කාලීන ණය පදනම මත ගල් අඟුරු මිලදී ගැනීම අරඹයා බව නැවත අවධාරණය කරනු කැමැත්තේමි. එහෙත් මේ වනවිට රටේ මූල්‍ය තත්වය යහපත් වෙමින් ඇති බැවින් හා ලංකා විදුලි බල මණ්ඩලය නව අයක්‍රම මත ආදායම් රැස් කිරීම ආරම්භ කිරීමෙන් යහපත් මූල්‍ය තත්වයන් වාර්තා වී ඇති බැවින් ඉදිරි ටෙන්ඩර්වලදී කාලීනව ගල් අඟුරු සැපයීම තහවුරු වන පරිදි මූල්‍ය සම්පාදනයන් පිළිබඳව පූර්ව එකඟතාවයක් ලබා ගැනීමේ හැකියාව පිළිබඳව වැඩි අවධානය යොමුකර ඇත. |
| 05 | එසේ එක් සැපයුම්කරුවකුට වැඩි සංඛ්‍යාවකගේ එකතුවකින් ප්‍රසම්පාදන සඳහා කටයුතු කරන්නේ නම් එම එකතුව නෛතික පුද්ගලභාවයක් ඇති බවට තහවුරු කරගත යුතු අතර එයට තිබිය යුතු ශක්‍යතාවයන් හා නෛතික බැඳීම් දැඩිව තහවුරු වන පරිදි ලංසු ලේඛන හා ගිවිසුම් ශක්තිමත් කර ගුණාත්මක ගල් අඟුරු තොග කාලීනව ලැබීම තහවුරු කර ගත යුතුය. | මේ සම්බන්ධව අවධානය යොමු කිරීමෙන් අනතුරුව විවෘත ජාත්‍යන්තර ටෙන්ඩර් ක්‍රියාවලියක් ආරම්භ කිරීමේදී ගල් අඟුරු සමාගම විසින් දැනට සැපයුම්කරුවකු ලියාපදිංචි කිරීමේදී මූල්‍ය හා තාක්ෂණික ශක්‍යතාවය ඇගයීමට ලක් කරනු ලබන අවම මූලික සුදුසුකම් ලංසු ලේඛනවල ලංසුකරුවන් ඇගයීමේ නිර්ණායක ලෙස ඇතුළත් කර ඇත. ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් ලංසු ලබාගැනීමේදී මෙම තත්වය බලපෑමක් සිදු නොවේ. මේ වනවිටත් විවෘත ලංසු කැඳවීමේදී සුදුසුකම් ලැබීමේ නිර්ණායක ලෙස (Eligibility criteria) වගන්ති 2.8 විවෘත ජාත්‍යන්තර ලංසු කැඳවීමේ ලේඛනයට ඇතුලත් කර ඇත. |
| 06 | ගල් අඟුරු ප්‍රසම්පාදනයට අදාළ සංයුක්ත දර්ශක තීරණය කිරීමේදී උපරිම ආර්ථික වාසියක් රජයට ලබා ගත හැකි පරිදි එම දර්ශක සකස් කිරීමට යොදා ගන්නා කලාපීය දර්ශක පිළිබඳව කාලීනව නැවත සලකා බැලීමට කටයුතු කල යුතුය. | මේ පිළිබඳව අවධානය යොමුකර කටයුතු කරන ලෙස අදාල අංශ වෙත දැනුම්දී ඇත. තවද අවිනිශ්චිත තාවයකදී රටට වඩාත් හිතකර දර්ශක භාවිතා කිරීම පිළිබඳ ජන හා සංඛ්‍යා ලේඛණ දෙපාර්තමේන්තුව වෙතින් ද මේ පිළිබඳ තවදුරටත් නිරීක්ෂණ ලබාගැනීමට ගල් අඟුරු සමාගම කටයුතු කර ඇත. තවද කොළඹ විශ්ව විද්‍යාලයෙන් ද මේ පිළිබඳ නිරීක්ෂණ ඉල්ලා ඇති අතර සියලු කලාපීය දර්ශකයන් පිළිබඳව කාලීනව නැවත සලකා බැලීමක් කරමින් වඩාත් වාසිදායක දර්ශක මත පිහිටා ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීමට අවශ්‍ය සැලසුම් සකස් කර ඇත. |

| | | |
|---|---|---|
| 07 | 2022 සැප්තැම්බර් 22 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයෙහි විවෘත ජාත්‍යන්තර ටෙන්ඩර් ක්‍රියාවලිය අනුගමනය කරමින් හා දැනට ලියාපදිංචි සැපයුම්කරුවන්ටද ප්‍රසම්පාදනයට සහභාගි වීමට අවස්ථාව ලබා දෙමින් ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කිරීමට අනුමැතිය ලබාදී තිබුණු අතර විවෘත ජාත්‍යන්තර ටෙන්ඩර් ක්‍රියාවලියක් ආරම්භ කිරීමේදී ගල් අඟුරු සමාගම විසින් දැනට සැපයුම්කරුවකු ලියාපදිංචි කිරීමේදී මූල්‍ය හා තාක්ෂණික ශක්‍යතාවය ඇගයීමකට ලක් කරනු ලබන අවම මූලික සුදුසුකම ලංසු ලේඛනවල ලංසුකරුවන් ඇගයීමේ නිර්ණායක ලෙස ඇතුළත් කල යුතු බව නිර්දේශ කෙරේ. | මෙ සම්බන්ධව අයිතම අංක 05 හි පිළිතුරු ලබාදී ඇත. |
| 08 | මෙම ප්‍රසම්පාදනයට `අදාළව වඩාත් ප්‍රශස්ත අනුමැතීන් ලබා දිය හැකි වන පරිදි අවශ්‍ය අධ්‍යයනයන් කිරීමට සහ තොරතුරු ලබා ගැනීමට ප්‍රමාණවත් කාලයක් අමාත්‍ය මණ්ඩලය වෙත ලැබෙන ලෙස නිවැරදි තොරතුරු අප්‍රමාදව ඉදිරිපත් කිරීමට අදාළ නිළධාරීන්ට නියම කිරීම. | ඉදිරි ප්‍රසම්පාදනයන්හිදී ඒ අනුව කටයුතු කිරීමට කටයුතු කරමින් පවතී. |

.................................
සභාපති
ලංකා කෝල් පුද්ගලික සමාගම
03/05/23

.................................
ලේකම්
විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය
03/05/2023